# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 01/2017**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2017 ජනවාරි මස 2 දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>ගණකාධිකාරී / මූල්‍යාධිකාරී / අභ්‍යන්තර විගණක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>**

2011.11.15 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 971 හි නියම කර ඇති ගණකාධිකාරී / මූල්‍යාධිකාරී / අභ්‍යන්තර විගණක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. උප කුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව (CVCD) විසින් අමතර සුදුසුකම් කාණ්ඩයක් ඇතුළත් කිරීම සඳහා කරන ලද යෝජනාව සලකා බලා, ගණකාධිකාරී / මූල්‍යාධිකාරී / අභ්‍යන්තර විගණක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය <u>ඇමුණුම I හි</u> සඳහන් කර ඇති පරිදි සංශෝධනය කිරීමට කොමිෂන් සභාව විසින් 2016.11.17 දින පැවැති සිය 953වන සභා වාරයේ දී තීරණය කරන ලදී.

03. සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය 2017.01.02 දින සිට ක්‍රියාත්මක වේ.

04. ඒ අනුව, 2011.11.15 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 971 හි සඳහන් කර ඇති ගණකාධිකාරී / මූල්‍යාධිකාරී / අභ්‍යන්තර විගණක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2017.01.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කෙරේ.

05. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අත්. කළේ / මහාචාර්ය මොහාන් ද සිල්වා**

**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන්/ සහකාර ලේඛකාධිකාරිවරුන්
12. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසී /එච්ආර්/ 2/3/210

ඇමුණුම I

| තනතුරු නාමය | බඳවා ගැනීමේ ක්‍රමය | සුදුසුකම් |
|---|---|---|
| ගණකාධිකාරී / මූල්‍යාධිකාරී / අභ්‍යන්තර විගණක<br><br>වැටුප් කේතය :<br><br>U-EX3 (II) | විවෘත දැන්වීමක් මගින්<br><br>තෝරා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්<br><br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී 40% ක් හෝ ඉහළ ලකුණු ලබා ගත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා සලකා බැලීමට සුදුසුකම් ලබයි. | 1.(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) හෝ ඒ හා සමාන ආයතනයක සාමාජිකත්වය දැරිය යුතුය;<br><br>සහ<br><br>(ආ) ඉහත 1 (අ) හි සුදුසුකම ලැබීමෙන් අනතුරුව අවම වශයෙන් වසර හයක (06) ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳව විධායක මට්ටමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු වීම.<br><br>**හෝ**<br><br>2. පහත දේ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන අයතනයක/ ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර දරන්නකු වීම;<br><br>• එම තනතුරෙහි ස්ථිර කර තිබීම සමඟ එම තනතුරෙහි වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් තිබීම; එයින් එක් වසරක් ( 01) ඉහත 1 (අ) හි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව විය යුතුය.<br><br>**හෝ**<br><br>3. පහත සියලු දේ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන අයතනයක/ ආයතනයක ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හෝ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුර දරන්නකු වීම; |

| | | |
|---|---|---|
| | | • එම තනතුරේ ස්ථිර කර තිබීම සමඟ ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳව විධායක මට්ටමක වසර දහයක (10) පළපුරුද්ද;<br><br>• ඉහත වසර දහයක (10) සේවා කාලයෙන් අවම වශයෙන් වසර අටක (08) ක සතුටුදායක සේවයක් විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හෝ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරේ සේවය කර තිබිය යුතුය;<br><br>• ඉහත වසර අටක (08) පළපුරුද්දෙන් වසර තුනක් (03) ඉහත 1 (අ) හි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව විය යුතුය.<br><br>**හෝ**<br><br>4. පහත සියලු දේ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන අයතනයක/ ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර දරන්නකු වීම;<br><br>• එම තනතුරෙහි ස්ථිර කර තිබීම;<br>• ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍ය සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම;<br>• පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් ගණකාධිකරණය / මූල්‍ය / කළමනාකරණය* පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;<br>• ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳව විධායක මට්ටමක වසර දොළහක (12) පළපුරුද්ද; |

| | | |
|---|---|---|
| | | • ඉහත පළපුරුද්දෙන් වසර දහයක් (10) විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හෝ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරේ සේවය කර තිබිය යුතුය.<br><br>**හෝ**<br><br>5. පහත සියලු දේ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ /උසස් අධ්‍යාපන අයතනයක/ ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර දරන්නකු වීම;<br><br>• එම තනතුරෙහි ස්ථිර කර තිබීම සමඟ එම තනතුරෙහි වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් තිබීම;<br><br>• පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ප්‍රථම උපාධියක් ලබා ගෙන තිබීම;<br><br>• ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම<br><br>හෝ<br><br>• ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය (SLIATE) හෝ එහි පූර්වගාමී ආයතනය විසින් පවත්වන ලද ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව ( HNDA);<br><br>• ඉහත සඳහන් කරන ලද අන්තර්මධ්‍යම සුදුසුකම / ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව (HNDA) ලබා ගැනීමෙන් අනතුරුව ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳව විධායක මට්ටමක වසර දහහතරක (14) පළපුරුද්ද;<br><br>• ඉහත පළපුරුද්දෙන් අවම වශයෙන් වසර පහක් (05) U-EX |

| | | |
|---|---|---|
| | | 2(I) වැටුප් කේතය මගින් දක්වන වැටුප් පරිමාණය දරන විශ්වවිද්‍යාල පද්ධතියේ නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරක සහ / හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක හෝ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරක විය යුතුය.<br><br>**හෝ**<br><br>**6.** පහත සියලු දේ සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ /උසස් අධ්‍යාපන අයතනයක/ ආයතනයක නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුර දරන්නකු වීම;<br><br>• එම තනතුරෙහි ස්ථිර කර තිබීම ;<br><br>• පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් ප්‍රථම උපාධිය<br><br>හෝ<br><br>• ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) අන්තර්මධ්‍යම සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම<br><br>හෝ<br><br>• ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) හෝ එහි පූර්වගාමී ආයතනය විසින් පවත්වන ලද ගණකාධිකරණය පිළිබඳ උසස් තාක්ෂණ ඩිප්ලොමාව ( HNDA);<br><br>• විශ්වවිද්‍යාල පද්ධතියේ ගණකාධිකරණය සහ / හෝ විගණනය පිළිබඳ වසර දහඅටකට ( 18) නොඅඩු පළපුරුද්දක් |

| | | |
|---|---|---|
| | | තිබීම<br><br>• ඉහත පළපුරුද්දෙන් වසර තුනක් (03) විශ්වවිද්‍යාල පද්ධතියේ නියෝජ්‍ය ගණකාධිකාරී / නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හෝ නියෝජ්‍ය මූල්‍යාධිකාරී තනතුරක විය යුතුය.<br><br>හෝ<br><br>7. පහත දේ සමඟ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරී II ශ්‍රේණියේ තනතුරක් දැරීම;<br>• ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CASL) හෝ ඒ හා සමාන ආයතනයක සාමාජිකත්වය දැරිය යුතුය;<br><br>හෝ<br><br>පිළිගත් විශ්වවිද්‍යාලයකින් /උසස් අධ්‍යාපන ආයතනයකින් ගණකාධිකරණය / මූල්‍ය / කළමනාකරණය* පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br><br>සටහන : **'ගණකාධිකරණ සහ / හෝ විගණන'** පළපුරුද්ද යනු රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගණකාධිකරණ සහ / හෝ විගණනයේ විධායක මට්ටමක ලබා ගත් පළපුරුද්දයි.<br><br>* 'කළමනාකරණය' යන යෙදුමෙන් අර්ථ දැක්වෙනුයේ ගණකාධිකරණය සහ මූල්‍ය ප්‍රධාන සංරචක සමඟ කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියකි. |